**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2013**

---

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත මණ්ඩලයේ ගනුදෙනු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 පෙබරවාරි 9 වන දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී. ඊට වැඩිමනත් වශයෙන් මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව වාර්තාකරණ දිනයෙන් පසු සාධාරණ කාලපරිච්ඡේදයක් තුළදී ඒවා පරිශීලකයන්ට ලබා නොදෙන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රයෝජනවත්භාවය හානිකරණයට භාජනය වන බවත් වාර්තාකරණ දිනයෙන් මාස 06 ක කාලයක් තුළදී එහි මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ හැකියාව ආයතනයට තිබිය යුතුවේ. 2013 මූල්‍ය වර්ෂයට අදාල ගිණුම් 2016 දෙසැම්බර් 30 දින ඉදිරිපත් කළ නමුත් 2014, 2015 සහ 2016 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන 2017 පෙබරවාරි 28 දින දක්වාත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත්කළ පසු ආරම්භකළ යුතු වුවත් මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් මිලදී ගන්නා වර්ෂයේදී ක්ෂය නොකිරීමත් ඉවත් කරන වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීමත් යන ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබූ අතර උපයෝජනය කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. ප්‍රදාන යටතේ මිලදීගත් ස්ථාවර වත්කම් වාර්ෂිකව ක්ෂය කර ලියාහල අගයට දක්වා ඇති නමුත් එම වත්කම් වෙනුවෙන් ක්‍රමක්ෂය ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනය සමාලෝචිත වර්ෂයේ සිදුකර නොතිබූ නමුත් 2014 වර්ෂයේ කරන ලද සත්‍යාපන තොරතුරු පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භෞතිකව පවතින වත්කම් හඳුනාගෙන තිබුණි. මෙම ශේෂය ලෙජර ශේෂය සමඟ නොසැසඳුනු බැවින් එම වෙනස වූ රු.1,210,119 ක් හඳුනානොගත් වත්කම් ලෙස දක්වා තිබුණි. තවදුරටත් කරන ලද පරීක්ෂණයේදී අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.943,536 ක ඉන්වෙන්ට්‍රි භාණ්ඩද ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ වටිනාකම රු.2,153,655 ක වත්කම් භෞතිකව නොපැවතුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

-----------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයේ රු.178,220 ක්වූ සේවක ණය සහ අත්තිකාරම් සම්බන්ධ උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවිය.

**2.3 ගෙවිය යුතු ගිණුම්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1991 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගෙවිය යුතු රු.701,110 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වර්ෂ 3 සිට වර්ෂ 10 දක්වා පැරණි රු.161,651 ක් වූ රඳවා ගැනීම් බදු මුදල් 2016 දෙසැම්බර් 31 දින දක්වාම එම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 11 පරිශිෂ්ටය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 13,747,104 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 11,579,955ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,167,149 ක ඌනතාවයේ වැඩිවීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රාජ්‍ය ප්‍රදාන සියයට 3.9 කින් වැඩිවී තිබූ නමුත් ආයතන හා පරිපාලන වියදම් සියයට 9 කින් වැඩිවීම ඉහත ඌනතාවය වැඩිවීමට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලබාදුන් මුදල් අදාල කාර්යයන් සඳහා වැය කිරීමකින් තොරව මණ්ඩලය තුළ රඳවාගෙන තිබුණි. ඉකුත් වර්ෂවල මෙසේ වැය නොකළ මුදල රු.8,240,964 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ ලද මුදලින් රු.473,679 ක් අදාල කාර්යයන් සඳහා වැයකර නොතිබුණි.

(ආ) නැවත බෙදාහැරීමේ පරමාර්ථයෙන් දේශීය හා විදේශීය විවිධ පොත් පරිත්‍යාගශීලී ආයතන හා පුද්ගලයින් විසින් වටිනාකමින් ඉහළ මෙන්ම වටිනාකමින් අඩු පොත් විවිධ අවස්ථාවලදී මණ්ඩලයට පරිත්‍යාග කරනු ලබන අතර එම පොත් පරිත්‍යාග අත්කරගැනීම සඳහා මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ, ව්‍යාපෘතියක් හඳුනාගෙන නොතිබූ අතරම මණ්ඩලයට පරිත්‍යාග ලෙස ලද පොත් ව්‍යාප්ති සේවා අංශය වෙත යොමුකර තිබූ බවත් විධිමත් පරිදි ලේඛනගත කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ව්‍යාප්ති සේවා අංශය වෙත පරිත්‍යාග ලෙස ලැබෙන පොත් එම අංශය විසින් පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීමේ ව්‍යාපෘතියට අනුව පුස්තකාල වෙත බෙදාහැරීමේ කටයුතු කරගෙන යනු ලබන නමුත් එම වත්කම් පිළිබඳව ආරක්ෂිත වැඩ පිළිවෙළක් ඇතිකර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

අයවැයගත හා තත්‍ය ආදායම් වියදම් අතර සියයට 30 සිට සියයට 69 දක්වා පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලනයන්**

**---------------------------**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | (i) | නියමිත දිනට ගිණුම් ඉදිරිපත් නොකිරීම. |
| | (ii) | ගිණුම් හා පොත්පත් අතර නොගැලපීම් නිරීක්ෂණය වීම. |
| (ආ) අත්තිකාරම් පාලනය | | අත්තිකාරම් සම්බන්ධ ලේඛන නිසි පරිදි පවත්වා නොගැනීම. |
| (ඇ) තොග පාලනය | (i) | ව්‍යාප්ත සේවා අංශයට පරිත්‍යාග සඳහා ලැබෙන පොත් තොගයට ඇතුළත් නොවීම. |
| | (ii) | පොත් 5144 ක ඌනතාවයක් තොග සමීක්ෂණයේදී හඳුනා ගැනීම. |
| (ඇ) වත්කම් කළමනාකරණය | (i) | වත්කම් ලේඛනය ගිණුම් සමඟ නොගැලපීම. |
| | (ii) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව නියමිත වේලාවට වත්කම් සමීක්ෂණය සිදු නොකිරීම. |